# 9 රචනය

ඉගෙනුම් ක්‍රියාවලිය අවසානයේ දී ඉගෙනුම් ඵල අප තුළ කෙතරම් දුරට පිහිටා ඇත්දැයි මැන බලන ක්‍රම රාශියකි. ඒ අතර විශ්ලේෂණය යනු එකකි. ඉන් අදහස් කෙරෙන්නේ යමක් වෙන් කර දැක්වීම, විස්තර කිරීම, බෙද දැක්වීම ආදිය යි. භාෂාවක් ඉගෙනීමේ දී අප තුළ ඒ හැකියාව (නිපුණතාව) පවතී දැයි සොයා බලන්නේ වාක්‍ය රචනයෙනි. විෂය නිර්දේශයට අනුව වාක්‍ය රචනාවක් යනු කුමක්දැයි හඳුනා ගැනීම මේ පාඩමෙන් අපේක්ෂිත ය.

## 9.1 වාක්‍ය රචනය



කරතොට ශ්‍රී සුචරිතෝදය පිරිවෙනේ දෙවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුනීත පොඩි හාමුදුරුවෝ පන්තියේ වැඩවලට හරිම දක්ෂ ය; කැප වෙලා වැඩ කරනවා. සුනීත පොඩි හාමුදුරුවන්ගේ තිබෙන එක විශේෂ දෙයක් තමයි, පසුවදට තිබෙන පාඩම් පිළිබඳ ව කලින් දවසේ සූදනම් වෙලා යන එක. එද සුනීත පොඩි හාමුදුරුවෝ පිරිවෙනේ සිංහල උගන්වන සෝමරතන හාමුදුරුවන්ගේ කුටියට වැඩියේ **වාක්‍ය රචනය** පිළිබඳ කරුණු දැනගෙන එන්න.

සෝමරතන හාමුදුරුවෝ හමුවුණු සුනීත පොඩි හාමුදුරුවෝ පාද නමස්කාර කරලා එකත් පසෙක වී වාක්‍ය රචනය පිළිබඳ තොරතුරු අහන්න පටන් ගත්තා.

" හාමුදුරුවනේ වාක්‍යය රචනයක් කියන්නේ මොකක් ද?"

ඒ සුනීත පොඩි හාමුදුරුවන්ගේ පළමු ප්‍රශ්නය .

" පොඩි නම, රචනය කියන එකේ තේරුම විසිතුරු ලෙස ගැළපීම කියන එකයි. වාක්‍ය රචනාවත් විසිතුරු ලෙස ගැළපීමක්. භාෂාව යොද ගෙන අදහස් විසිතුරු ලෙස ගැළපීමෙන් වාක්‍ය රචනයක් ලියන්න පුළුවන්".

" හාමුදුරුවනේ වාක්‍ය රචනා කියන එකේ තේරුම නම් දැන ගත්තා. ඒ ගැන තවත් ටිකක් විස්තර කරලා දෙනව ද"?

"ඔව් පොඩිනම වාක්‍ය රචනාවකින් කෙරෙන්නේ..................

කිසියම් මාතෘකාවකට අනුව භාෂාව යොද ගෙන අදහස් සමූහයක් මනාව ඉදිරිපත් කිරීම යි.

එහි දී අනුගමනය කළ යුතු රටාවක් තිබෙනවා මෙන්න මෙහෙම................

- පළමු ව මාතෘකාව කියවා තේරුම් ගැනීම.
- මාතෘකාවට අදාළ කරුණු ප්‍රමාණවත් ලෙස ගොනු කර ගැනීම.
- අනුපිළිවෙළට කරුණු ඉදිරිපත් කිරීම.
- කරුණු පැහැදිලි ව ඉදිරිපත් කිරීම.
- සුදුසු භාෂා විලාසයකින් අදහස් නිවැරදි ව, අලංකාරවත් ව ඉදිරිපත් කිරීම.



" පොඩිනම වාක්‍ය රචනාවක් ලිවීමේ දී මේ කරුණුවලට අමතර ව පහත කරුණු ගැන ද සැලකිලිමත් විය යුතු වෙනවා".

" ඒ මොනවා ද අපේ හාමුදුරුවනේ"?

නිවැරදි අකුරු නිවැරදි තැන ලිවීම වාක්‍යය රචනයක වැදගත් කාරණයක්. අක්ෂර වින්‍යාසය කියන්නේ ඒකට. එහි දී අකුරු පැහැදිලි ලෙස ලිවීම ද වැදගත් වෙනවා. නැතිනම් රචනය බලන, කියවන කෙනාට එය අපහසු වෙනවා.

ඒ වගේ ම හරියාකාර ව පද වෙන් කිරීම, විරාම ලකුණු යෙදීම, ඡේද වෙන් කිරීම, වැනි දේ ද රචනයක තිබිය යුතු වෙනවා.

මේ රචනා හඳුන්වන්නේ වාක්‍ය රචනා කියලනේ. ඒ නිසා උක්තය ආඛ්‍යාතය ගැළපුණු වාක්‍ය, රචනය පුරා ම ලිවීම වැදගත්.

මේ සියලු තොරතුරු අහගෙන සිටිය සුනීත පොඩි හාමුදුරුවෝ රචනය ගැන තවත් ප්‍රශ්න අහන්න පටන් ගත්තා.

"හාමුදුරුවනේ අපි මේ ලියන රචනාවලට කොටස් තිබෙනවා ද"?.

"ඔව් පොඩිනම, රචනාවක් ප්‍රධාන කොටස් තුනකට බෙදෙනවා". ඒ තමයි,

- ආරම්භය.
- අන්තර්ගතය.
- අවසානය.

ආරම්භය කොටසින් සිද්ධ වෙන්නේ මාතෘකාව හැඳින්වීම යි. රචනයක මධ්‍ය

කොටස හෙවත් ස්කන්ධය වැදගත් ම කොටස යි. රචනයේ අන්තර්ගතය යන්නෙන් අදහස් කරන්නේ මෙම කොටස යි.

එහි දී කෙරෙන්නේ මාතෘකාවට අනුව කරුණු විස්තර කර දැක්වීම යි. මේ සඳහා මාතෘකාවට අනුව හොඳින් දැනුම ලබා ගෙන තිබීම වැදගත්. පොත පත කියවීමෙන්, අසා දැන ගැනීමෙන් හෝ විවිධ ක්‍රමවලින් දැනුම ලබා ගත යුතු වෙනවා.

"රචනාවක් අවසාන කරන්නේ මාතෘකාව ගැන තමන් දරන අදහසකිනි.''

"හාමුදුරුවනේ රචනාව ගැන අපි දැන ගත යුතු වන්නේ ඔය තොරතුරු ටික විතර ද"?

" නෑ පොඩිනම රචනාවක් ලිවීමට පෙර තමන් තෝරා ගත් මාතෘකාවට අනුව සැකිල්ලක් හද ගන්න ඕනැ. එතකොට කරුණු ගිලිහෙන්නට නොදී රචනාව පිළිවෙළකට ලියන්න පුළුවන්. පහත දක්වෙන්නේ "මවුපිය උපස්ථානය" යන මාතෘකාවට අනුව රචනා සැකිල්ලක් හදගන්නා ආකාරය යි.

**මවුපිය උපස්ථානය**

- මවුපියෝ නම් කවරහු ද?
- ඔවුන් අප වෙනුවෙන් කළ කැප කිරීම කවරාකාර ද?
- ඔවුන්ට උපස්ථාන කරන්නේ කෙසේ ද?
- මවුපියන්ට උපස්ථාන කිරීමෙන් දරුවන් සමාජයේ පිළිගැනෙනසුලු පිරිසක් වන අයුරු.

මවුපිය උපස්ථානය යන මාතෘකාවට මේ ආකාරයට රචනා සැකිල්ලක් සකස් කර ගත යුතු බව පැවසූ සෝමරතන හාමුදුරුවෝ වාඩි වී සිටි ආසනයෙන් නැගිට උන්වහන්සේගේ කුටියට වැඩම කළා. නැවත සුනීත පොඩිහාමුදුරුවන් ඉදිරියේ පෙනී සිටි උන්වහන්සේ සුනීත පොඩි හාමුදුරුවන්ට පිටුවක් පුරා ලියන ලද කොළයක් දුන්නා.

" සුනීත පොඩිනම මේ තියෙන්නේ ගිය අවුරුද්දේ දෙකේ පන්තියේ හිටිය විද්‍යානන්ද පොඩිනම මවුපිය උපස්ථානය ගැන ලියපු වාක්‍ය රචනයක්, කියවල බලන්නකො...................

ඒ උන්නාන්සේ ගිය අවුරුද්දේ සමස්ත ලංකා රචනා තරගයෙනුත් පළමුවෙනියා වුණා."

## මවුපිය උපස්ථානය

නිවසේ දෙවියන්, දෙගුරුන් යන නම්වලින් මවුපියන් හැඳින්වේ. හිරු උදවන්නේ නැගෙනහිර දිසාවෙනි. නැගෙනහිරින් හිරු උදවෙත් ම ලෝකය ආලෝකවත් වෙයි. දෙමවුපියන් නිසා දරුවන්ගේ ලෝකය ද ආලෝකවත් වෙයි. ඒ නිසා අප බුදුරජාණන් වහන්සේ මවුපියන් හැඳින්වීමට පෙරදිග නැතහොත් නැගෙනහිර දිසාව යන නම යෙදූහ.

දරුවකු මවුකුස පිළිසිඳ ගත් ද සිට දස මසක් කුස තුළ දරාගෙන මෙලොවට බිහි කිරීමට මවක දරන වෙහෙස වචනවලින් කියා නිම කළ නොහැකි ය. ලොව පුදුමයට පත් කරවමින් රතු ලේ සුදට හරවා දරුවාට පෙවීම තුළින් මවගේ ආදරය පතුරවයි. මව මෙන් ම පියා ද දරුවාගේ ජීවිතය සැපවත් කරන්නට අසීමිත වෙහෙසක් දරයි. දහදිය වගුරුවමින් දරුවන් පෝෂණය කරන්නට, රැකගන්නට පියා සිය ජීවිතය ම කැප කරයි.

මවත් පියාත් එක් වී අව්වැසි, දුක් පීඩා, කම්කටොලු සියල්ල ඉවසමින් දරුවන්ගේ ලෝකය බබළවන්නට වෙහෙසෙන්නේ කිසිදු ලාභ ප්‍රයෝජනයක් බලාගෙන නොවේ.

මේ ආකාරයෙන් දරුවන් වෙනුවෙන් කැප වූ මවුපියන්ට අප ද යුතුකම් ඉටු කළ යුතු යි. ඒ සඳහා ඔවුන් වයසට යන කල් ම සිටිය යුතු නැත. කීකරු ව මැනවින් ඉගෙන ගැනීම ඔවුන්ට කළ හැකි උපස්ථානයක් වන අතර ඔවුන් වයසට ගිය විට ආහාරපාන ආදිය ලබා දී ආදරයෙන් රැක බලා ගැනීම ඔවුන්ට කළ හැකි හොඳ ම උපස්ථානය යි. මවුපිය උපස්ථානය උතුම් මංගල කරුණක් බව බුදුන් වහන්සේ මංගල සූත්‍රයේ දී දේශනා කළහ.

එපමණක් නොව හොඳින් ඉගෙන ගෙන ගුණ නුවණින් යුක්ත ව ලොවට වැඩදයී දරුවන් වීම, තම රට ජාතිය ආගම ආරක්‍ෂා වන අයුරින් ජීවත් වීම, දෙමාපිය දයාදයන් විනාශ නොකර අර්ථවත් ව පරිහරණය කරමින් කටයුතු කිරීම යනාදිය දරුවකුට තම මවුපියන් වෙනුවෙන් උපස්ථාන කළ හැකි කදිම පිළිවෙළකි.

මෙසේ මවුපියන්ට උපස්ථාන කරන දරුවන් සමාජයේ පිරිහීමට පත් වන්නේ නැත. ඔවුහු සමාජයේ ප්‍රශංසාවට පත් වෙති. දරුවන් අතර ඔවුහු සතුටින් කල් ගෙවති.

**අපිත් අපේ මවුපියන්ට ඉහත කී ලෙසින් උපස්ථාන කරන දරුවෝ වෙමු.**

සෝමරතන හාමුදුරුවන්ගෙන් මේ රචනය දැතින් ලබා ගත් සුනීත පොඩි හාමුදුරුවෝ උන්වහන්සේට වැඳ අවසර ගෙන නැවතත් පිරිවෙනට වැඩියේ පසුව ද පන්තියේ දී ඉගෙනීමට තිබෙන **වාක්‍ය රචනය** පිළිබඳ පාඩම ගැන කරුණු රාශියක් අවබෝධ කරගනිමිනි.

**ක්‍රියාකාරකම 9.1**

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) "වාක්‍ය රචනාව" යන්නෙහි තේරුම කෙටියෙන් දක්වන්න

ii) වාක්‍ය රචනයක් ලිවීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙළ වගුගත කරන්න.

iii) හොඳ රචනයක තිබිය යුතු තවත් කරුණු ලෙස මෙහි දක්වා ඇත්තේ මොනවා ද ?

iv) රචනයක කොටස් තුන නම් කරන්න.

v) රචනයක සැකිල්ල යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

vi) විද්‍යානන්ද පොඩි හාමුදුරුවන්ගේ රචනයේ දක්නට ඇති "මවුපිය උපස්ථානය සඳහා" කදිම පිළිවෙළ යනු කුමක්ද ?

**ක්‍රියාකාරකම 9.2**

i) පහත සඳහන් මාතෘකා අනුව රචනා ලිවීම සඳහා සැකිලි පිළියෙල කරන්න.

1. දුටුගැමුණු රජතුමා.
2. පොසොන් උත්සවය.
3. කළගුණ සැලකීම.
4. මා දුම්රියේ ගිය පළමු දවස.
5. සිංහල අවුරුදු සිරිත්.

ii) පහත සඳහන් මාතෘකා යටතේ වාක්‍ය රචනා ලියන්න.

1. ඇසළ පෙරහර.
2. බුදුහාමුදුරුවෝ.
3. යහපත් මිතුරු ඇසුර.
4. මා පැවිදි වූ ද.
5. වැඩිහිටියන්ට සලකමු.